**සේරුවිල ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

සේරුවිල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**-----------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සභාවේ ස්ථාවර තැන්පතු මත ලද රු.990,980 ක පොළී ආදායම, ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම් රු.1,561,666 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය ලිඛිතව ලබා නොගැනීම නිසා ගිණුම්වල ඇතුලත් කර නොමැති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.4,350,456 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉන් රු.978,316 ක් වූ හිඟ ආදායම වර්ෂ 05 ඉක්මවූ ශේෂයන් වේ. | හිඟ අදායම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 වැනි රීතිය | පිරිවැය රු.120,099,308 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි . | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2021/09/29 දිනැති අංක PFD/PMD/Cir/2021/01 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ . | ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පිරිනැමීමේදී ආයතන ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී රු. 4,851,826 ක් වටිනා කොන්ත්‍රාත් 05 ක් පිරිනමා තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රෙල්බ 01/2001 අනුව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 4,561,496 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 3,129,409 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුලී | | |
| (i) | ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2020 සහ 2021 වර්ෂවලට අදාළව අයවිය යුතුව තිබූ රු.1,707,374 ක කඩකුලී ආදායමක් 2021 නොවැම්බර් 25 දිනැති අංක T/SE/PS/Cou:Desi/2021/Nov/534 සභා තීරණය අනුව කපා හැර තිබුණි. | අදාල මුදල් අත්හැරීම ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා යොමු කර ඇත. | ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනට රු.1,161,331 ක කුලී ආදායමක් හිඟව පැවති අතර 2011 සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරාසයට අයත් මෙම හිඟ මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද සභාව කටයුතු කර නොතිබුණි. | අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙනත් ආදායම්<br>------------------ | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි උසාවි දඩ ආදායම වූ රු.3,243,125 න් සියයට 52 ක් වූ රු.1,681,459 ක හිඟ ආදායම 2018 වසරේ සිට පැවත එන්නක් වූ අතර අදාළ හිඟ ආදායම අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | වෙනත් ආදායම් යටතේ ඇති සභාවේ වාහනවලින් ඉපයූ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.1,688,100 ක් වූ අතර වර්ෂය තුළ දරන ලද වියදම රු.1,997,198 ක් විය. ඒ අනුව ආදායම් ඉපයිය හැකි වාහන කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී අඩුපාඩු නිවැරදි කරගනිමින් අවශ්‍ය පරිදි කටයුතු කරන බව දන්වමි. | වාහන ඵලදායීව උපයෝජනය කර ආදායම වැඩි කර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් 2019 දෙසැම්බර් 16 වන දින මිලට ගත් රු.233,480 ක් වටිනා කෝබ්‍රා වර්ගයේ වීදි ලාම්පු 26 ක් සහ 2021 සැප්තැම්බර් 20 වන දින රු.500,520 ක් ගෙවා මිලට ගත් වීදි ලාම්පු 129 ක් විගණිත දිනය වූ 2022 අප්‍රේල් 06 දින වන විටත් ගබඩාවෙහි නිශ්කාර්යව පවතින බව තහවුරු විය. | රටේ පවතින තත්වය අනුව, වීථි ලාම්පු යෙදීම තාවකාලිකව නතර කර ඇත. | මිලදී ගත් භාණ්ඩ ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | වර්ෂ 04 කට වඩා වැඩි කාලයක සිට නිශ්කාර්යව පවතින රු.10,053,824 ක් වටිනා වාහන (වාහන කොටස්) 13 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ නිසි ලෙස බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ නිසි ලෙස බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 02/2017 දරන 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සේරුවිල ප්‍රාදේශීය සභාවට අයත් නොවන, සභාව විසින් භාවිතා කරන රු.33,967,132 ක් වටිනා වාහන 09 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව වෙත පවරා ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අදාළ වාහන කඩිනමින් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 අනුව ප්‍රමාදවී ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කළ යුතු වුවද ප්‍රාදේශීය සභාව විසින් අවස්ථාවන් 08 කදී ප්‍රමාදවී ලද මිල ගණන් සමාලෝචනය කර රු.585,765 ක් වටිනා ප්‍රසම්පාදනයන් පිරිනමා තිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවීමට වගබලා ගන්නා බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආදායම් පරීක්ෂක තනතුරෙහි පුරප්පාඩුව හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,483,804 හිඟ ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට ඉල්ලීම් ඉදිරිපත් කරන බව සඳහන් කරමි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| වැය විෂයයන් 13 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන රු.17,116,347 ක් ඉතිරි වී තිබුණු අතර එය ඇස්තමේන්තු ප්‍රතිපාදන වටිනාකමින් සියයට 50 සිට සියයට 98 දක්වා පරාසයක විය. | මනා පාලනයකින් යුතුව අයවැය සකස් කර කටයුතු පවත්වාගෙන යන බව දන්වමි. | වාර්ෂික අයවැය විධිමත් පාලන උපකරණයක් ලෙස භාවිත කළ යුතුය. |